සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

11869

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:-

1) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
2) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
3) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(1) අවශ්‍යතා හා වුවමනා පිළිබඳ නිවැරදි වගන්තිය වන්නේ,
1. අවශ්‍යතා අසීමිතයි, වුවමනා සීමිතයි.
2. අවශ්‍යතා ව්‍යාපාරියන්ට නිර්මාණ කළ හැකිය. වුවමනා ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ නොහැකිය.
3. අවශයතා ඒකීයයි. වුවමනා විවිධයි.
4. අවශ්‍යතා ද්විතීයිකයි. වුවමනා ප්‍රාථමිකයි.

(2) භාණ්ඩයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
1. අස්පෘශ්‍ය වීම
2. ඒකීය වීම
3. සපයන්නාගෙන් වෙන් කළ නොහැකි වීම
4. ගබඩා කළ නොහැකි වීම

(3) පහත සඳහන් ව්‍යාපාර අතරින් සේවා නිෂ්පාදන ව්‍යාපාර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. සබන් නිෂ්පාදනය, ආහාර නිෂ්පාදනය, ආහාර අලෙවිය
2. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය, ආපනය ශාලාවක් පැවැත්වීම, බාබර් සාප්පුවක් පැවැත්වීම.
3. පාන් සෑදීම, පාන් අලෙවිකිරීම, පාන් ප්‍රවාහනය කිරීම.
4. ටයර් නිෂ්පාදනය, ගරාජයක් පවත්වාගෙන යාම, ඇඳුම් අලෙවි කිරීම.

(4) පහත සඳහන් "A" තීරුවේ ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන්ද "B" තීරුවේ ඇල්ම දැක්වීමට හේතු ද දැක්වේ. ඒවා නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| 1. ණය දෙන ආයතන | P- ප්‍රමාණවත් ලාභයක් ලැබී තිබේද? |
| 2. කළමනාකරුවෝ | Q- රැකියාවේ සුරක්ෂිත බව |
| 3. සේවකයෝ | R- දී ඇති ණය ආපසු ලබාගත හැකිදැයි දැන ගැනීම. |
| 4. අයිතිකරුවෝ | S- තීරණ ගැනීමේ කටයුතු සඳහා |

1. RSQP  2. PQRS  3. QRSP  4. RSPQ

(5) පහත සඳහන් ප්‍රකාශන ඇසුරෙන් දේශපාලන පරිසරයට අදාළ වන ප්‍රකාශනය තෝරන්න.
1. භාණ්ඩවල මිල නොනවත්වා ඉහළ නැගීමෙන් උද්ධමනය ඇතිවේ.
2. සේවක උද්සෝෂණය නිසා එදින නිෂ්පාදනය සිදු නොවිය.
3. නව යන්ත්‍රසූත්‍ර යොදාගැනීම නිසා වැඩි නිෂ්පාදනයක් කළ හැකිවීම.
4. විදුලිය, ජලය, මහාමාර්ග වැනි යටිතල පහසුකම් සැපයීමට රජය මැදිහත් වේ.

(6) පහත සඳහන් ප්‍රකාශන අතරින් නිවැරදි ප්‍රකාශනය තෝරන්න.

1. රජය ව්‍යාපාර කෙරෙහි නීති රීති පැනවීමෙන් පාරිභෝගිකයන් ආරක්ෂා වේ.
2. පොලී අනුපාතය වැඩි කිරීම නිසා ව්‍යාපාරිකයන් ණය ලබා ගැනීමට වැඩිපුර පෙළඹේ.
3. මිල මට්ටම ඉහළ යාම නිසා පාරිභෝගිකයන්ට මිල දී ගැනීමේ හැකියාව වැඩිවේ.
4. වැටුප්, ආදායම් , ඉතිරිකිරීම්, ආයෝජන දේශපාලන පරිසරයට අයත් සාධකයන්ය.

(7) පහත සඳහන් "A" තීරුවේ රටවල් කිහිපයක් ද "B" තීරුවේ එම රටවල් භාවිත කරන මුදල් වර්ග කිහිපයක් ද දැක්වේ.

"A" තීරුව හා "B" තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ කුමක්ද?

| A | B |
|---|---|
| 1. ඉන්දියාව | P- ටකා |
| 2. බංග්ලාදේශය | Q- රුපියල් |
| 3. චීනය | R- රූබල් |
| 4. සෝවියට් දේශය | S- යුවාන් |

1. QPSR 2. PSRQ 3. SRQP 4. RQPS

(8) ව්‍යාපාරයක දැකිය හැකි ශක්තියක් හා අවස්ථාවක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?

1. ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම — පුහුණු සේවක හිඟය
2. කළමනාකරුවන්ගේ අත් දැකීම් — සේවක අයහපත් ආකල්ප
3. සුවිශේෂ නිෂ්පාදන ක්‍රම යෙදීම — නව නගර නිර්මාණය කිරීම
4. අධිවේගී මාර්ග ඉදි කිරීම — ස්වාභාවික ආපදා

(9) පහත සඳහන් ව්‍යාපාර සංවිධාන අතුරින් ලාභ අරමුණු කරගත් රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

1. සමුපකාර 2. සංස්ථාපිත සමාගම් 3. රාජ්‍ය සංස්ථා 4. රාජ්‍ය සමාගම්

(10) හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන නිවැරදිව වර්ගකර ඇති පිළිතුර කුමක්ද?

1. සුළු පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර
2. ලාභ අරමුණු කරගත් ව්‍යාපාර, ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර
3. ලාභ අරමුණු කරගත් ව්‍යාපාර, පෞද්ගලික අංශයේ ව්‍යාපාර
4. පෞද්ගලික අංශයේ ව්‍යාපාර, රාජ්‍ය අංශයේ ව්‍යාපාර

(11) රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. රන්මල් ග්‍රොසරි, මිහිරි පළතුරු අලෙවි සැල, ඔසුහල
2. ඔසුහල, ධීවර සංස්ථාව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
3. අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මැලිබන් සමාගම, ජෝන් කීල්ස් සමාගම
4. ජෝන් කීල්ස් සමාගම, දැව සංස්ථාව, කජු සංස්ථාව

(12) පහත සඳහන් තොරතුරු ඇසුරෙන් 12/13/14/15 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අශාන් මධුසංක විසින් මධුසංක ස්ටෝර්ස් නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය සීමිත වගකීමක් සහ නෛතික පුද්ගලභාවයක් ඇති ව්‍යාපාරයක් බවට පත් කිරීමට අදහස් කරයි.

"මධුසංක ස්ටෝර්ස්" ව්‍යාපාරය පහත සඳහන් කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් ද?

1. ඒක පුද්ගල ව්‍යාපාර 2. හවුල් ව්‍යාපාර 3. සංස්ථාපිත සමාගම් 4. දෙපාර්තමේන්තු

(13) අශාන් මධුසංකගේ ව්‍යාපාරය වෙනස් කිරීමෙන් පසු යෙදීමට සුදුසු නම පහත සඳහන් නම් අතරෙන් කුමක් විය හැකිද?

1. අශාන් ස්ටෝර්ස්
2. සී/ස මධුසංක පුද්ගලික සමාගම
3. අසංක ග්‍රොසරි
4. සංක කමියුනිකේෂන්

(14) මධුසංක ස්ටෝර්ස් යන ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශන අතුරෙන් වැරදි ප්‍රකාශනය තෝරන්න.

1. මෙය ලියාපදිංචි කිරීම අනිවාර්යය.
2. මෙය ලියාපදිංචි කළ යුත්තේ 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත යටතේය.
3. මෙය ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබේ.
4. මෙය ලියාපදිංචියෙන් ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ලැබේ.

(15)අශාන් මධුසංකගේ "මධුසංක ස්ටෝර්ස්" ව්‍යාපාරයත් ඔහු අනාගතයේ වෙනස් කිරීමට බලාපොරොත්තුවන ව්‍යාපාරයත් අතර පිළිවෙළින් ඇති වෙනස්කමක් දක්වන නිවැරදි ප්‍රකාශනය තෝරන්න.

1. ලාභය හවුලේ භුක්ති විඳීම හා ලාභය තනිව භුක්ති විඳීමය.
2. වගකීම අසීමිත වීම සහ වගකීම සීමිත වීම.
3. පැවැත්ම අඛණ්ඩ වීම සහ පැවැත්ම අඛණ්ඩ නොවීම.
4. නෛතික පුද්ගලභාවයක් තිබීම හා නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.

(16)පරිගණක ආශ්‍රිත ගිණුම්කරණය පිළිබඳව නිවැරදි ප්‍රකාශනය තෝරන්න.

1. කාලීන දත්ත ඉක්මනින් ලබාගැනීමට නොහැකිය.
2. අවශ්‍ය ශ්‍රමය අවම වීම නිසා ශ්‍රම වියදම වැඩිවේ.
3. තාක්ෂණික දෝෂ නිසා දත්ත නැතිවීමේ අවදානමක් තිබීම.
4. මෘදුකාංග මිලට ගැනීමට එතරම් මුදලක් අවශ්‍ය නොවීම.

(17)වත්කමක ලක්ෂණයක් නොවන්නේ,

1. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වීම.
2. ව්‍යාපාරයේ පාලනයට යටත් වීම.
3. අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.
4. වර්තමාන බැඳීමක් තිබීම.

(18)වගකීම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. ඉඩම් , ලී බඩු, යන්ත්‍ර
2. බැංකු ණය, වාහන, ණය හිමියෝ
3. බැංකු අයිරාව, ණය හිමියෝ, බැංකු ණය
4. ණය හිමියෝ, ණයගැතියෝ, මුදල්

(19)යම් දිනකට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

වත්කම් (150,000) = හිමිකම (100,000) + වගකීම් (50,000)

මෙම ව්‍යාපාරයේ රු.50,000 ක බැංකු ණයක් ලබා ගැනීමෙන් සහ රු. 20,000 ක ලී භාණ්ඩ මිලට ගැනීමෙන් පසු ගිණුම්කරණ සමීකරණය වන්නේ,

1. 200,000 = 100,000 + 100,000
2. 150,000 = 100,000 + 50,000
3. 200,000 = 150,000 + 50,000
4. 220,000 = 120,000 + 100,000

සයුරිගේ ව්‍යාපාරයේ 2015.01.01 දිනට පැවති වත්කම් සහ වගකීම් ගිණුම්වල ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| වත්කම් | රු | වගකීම් | රු |
|---|---|---|---|
| ඉඩම් | 500 000 | බැංකු ණය | 125 000 |
| ලී භාණ්ඩ | 100 000 | ණය හිමියෝ | 175 000 |
| ණයගැතියෝ | 50 000 | | |
| මුදල් | 50 000 | | |

ඉහත තොරතුරු ඇසුරෙන් 20 21 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(20)2015.01.01 දිනට ප්‍රාග්ධනය කීයද?

1. රු.1 000 000 2. රු. 700 000 3. රු. 400 000 4. රු. 300 000

(21)2015.01.01 දිනට ජංගම වත්කම්වල වටිනාකම කීයද?

1. රු.100 000 2. රු. 300 000 3. රු. 400 000 4. රු. 700 000

(22)පහත දක්වා ඇති එක් එක් ගිණුම්වල ද්විත්ව සටහන් මූලධර්ම අනුව සටහන් කරන ආකාරය දක්වා ඇත. නිවැරදි පිළිතුර තෝරන්න.

1. ගොඩනැගිලි ගිණුම් වැඩිවීම බැර අඩුවීම හර
2. බැංකු ණය ගිණුම් වැඩිවීම හර අඩුවීම බැර
3. වැටුප් ගිණුම් වැඩි වීම බැර අඩුවීම හර
4. විදුලි ගාස්තු ගිණුම් වැඩිවීම හර අඩුවීම බැර

(23)පහත "A" තීරුවේ මූලික සටහන් පොත් ද "B" තීරුවේ ගනුදෙනු ද දැක්වේ. "A" හා "B" තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| "A" | "B" |
|---|---|
| 1. මුදල් පොත | W රු. 10,000 ක් වටිනා යන්ත්‍රයක් ණයට ගැනීම. |
| 2. ගැණුම් ජර්නලය | X රු 20,000 කට භාණ්ඩ ණයට විකිණීම. |
| 3. විකුණුම් ජර්නලය | Y රු 40,000 කට භාණ්ඩ ණයට ගැනීම |
| 4. පොදු ජර්නලය | Z රු 50,000 ක් වැටුප් ගෙවීම |

1. YZXW 2. XZYW 3. ZYXW 4. ZWXY

(24)ණය ගැතියකුගෙන් ලැබී තැන්පත් කළ රු 15,000 ක චෙක්පතක් අගරු වී ඇත. එයට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ;

1. බැංකු ගිණුම් හර ණයගැති ගිණුම බැර
2. ණය ගැති ගිණුම හර බැංකු ගිණුම බැර
3. අගරු චෙක් ගිණුම හර ණය ගැති ගිණුම බැර
4. ණය ගැති ගිණුම හර අගරු චෙක් ගිණුම බැර

(25)අත්පිට විකුණුම් වෙනුවෙන් රු.20,000 ක චෙක්පතක් ලැබීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

1. මුදල් පොත හර රු. 20,000
   විකුණුම් ගිණුම බැර 20,000
2. බැංකු ගිණුම හර රු. 20,000
   විකුණුම් ගිණුම් බැර රු. 20,000
3. විකුණුම් ගිණුම හර රු 20,000
   මුදල් පොත බැර 20,000
4. විකුණුම් ගිණුම හර 20,000
   බැංකු ගිණුම බැර 20,000

(26)චමෝද්ගෙන් ලැබිය යුතු ණය මුදල රු. 10,000 කි. චමෝද් රු 9000 ක චෙක්පතක් එවීමෙන් ඔහුගේ ණය පියවුණි. එම ගනුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1. මුදල් පොත හර රු. 9000
   දුන් වට්ටම් ගිණුම හර 1000
   චමෝද් ගිණුම බැර 10000
2. මුදල් පොත හර 10,000
   චමෝද් ගි බැර 9000
   ලද වට්ටම් බැර 1000
3. මුදල් පොත හර 10,000
   චමෝද් ගිණුම බැර 10,000
4. චමෝද් ගිණුම් හර 9000
   බැංකු ගිණුම බැර 9000

(27)මූලික සටහන් පොත් පිළිබඳව කියවෙන වැරදි ප්‍රකාශනය තෝරන්න.

1. ව්‍යාපාර ගනුදෙනු ඒවායේ ස්වභාවය සහ පොදු ලක්ෂණ අනුව වර්ග කර සටහන් කිරීමට මූලික පොත් භාවිතා කරයි.
2. මූලික සටහන් පොත් ජර්නල් හා දෛනික පොත් යන නම්වලින් ද හැඳින්වේ.
3. මූලික සටහන් පොත් පිළියෙල කරන්නේ ලෙජර් ගිණුම වෙනුවට ය.
4. මූලික සටහන් පොත්වල ගනුදෙනු සටහන් කරන්නේ මූලාශ්‍ර ලේඛන උපයෝගී කර ගනිමිනි.

(28)වට්ටම් තීරු සහිත බැංකු ගිණුමේ වට්ටම් තීරු පිළිබඳ කියැවෙන නිවැරදි ප්‍රකාශනය තෝරන්න.

1. වට්ටම් තීරුවල වෙළඳ වට්ටම් සටහන් කරයි
2. වට්ටම් තීරුවල මුදල් වට්ටම් සටහන් නොකරයි
3. වට්ටම් තීරු තුලනය කර ශේෂය සොයයි
4. වට්ටම් තීරු සිහිවටන තීරු ලෙස හැඳින්වේ

(29)මුදල් පොතේ ද්විත්ව කාර්ය වන්නේ,

1. මුදල් ලැබීම් හරටත් ගෙවීම් බැරටත් සටහන් කිරීමයි
2. මුදල් ලැබීම් හා ගෙවීම් ද වට්ටම් ද සටහන් කිරීමයි
3. මුදල් පොතේ දුන් වට්ටම් හරට සහ ලද වට්ටම් බැරට සටහන් කිරීමයි
4. මූලික පොතක් ලෙස කටයුතු කිරීම හා ලෙජර් ගිණුමක් ලෙස කටයුතු කිරීම.

(30)බැංකු අයිරාව දැකගත හැකිවන්නේ,

1. මුදල් පොතේ ඉදිරියට ගෙනා හර ශේෂයක් ලෙසයි
2. මුදල් පොතේ ඉදිරියට ගෙනා බැර ශේෂයක් ලෙසයි
3. බැංකු ගිණුමේ ඉදිරියට ගෙනා හර ශේෂයක් ලෙසයි
4. බැංකු ගිණුමේ ඉදිරියට ගෙනා බැර ශේෂයක් ලෙසය

(31) බැංකු ප්‍රකාශනයේ ශේෂය බැංකු ගිණුමේ ශේෂයට වඩා වැඩි වීමට බලපාන හේතුව වන්නේ,

1. බැංකු ගාස්තු
2. ණය ගැති ප්‍රේෂණ
3. තැන්පත් කර අගරු වූ චෙක්පත්වල වටිනාකම
4. තැන්පත් කර නිෂ්කාශනය නොවූ චෙක්වල අගය

(32) 2015.01.31 දිනට ව්‍යාපාරිකයාගේ බැංකු ගිණුමේ ශේෂය රු. 20,000 ක් වූ අතර එදිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු.22000 ක් විය. මෙම ශේෂයන්ගේ වෙනසට හේතුව විය හැක්කේ,

1. තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක් රු. 2000/= කි.
2. නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්වල වටිනාකම රු. 2000/= කි.
3. මුදල් පොතේ සටහන් නොවූ බැංකුව අය කළ බැංකු ගාස්තු රු. 2000/= කි.
4. ස්ථාවර නියෝගමත කළ රක්ෂණ ගාස්තුව රු. 2000/= කි.

(33) පවනි ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 2000 කි. 2015.01.31 දිනට සුළු මුදල් භාරකරු සතුව තිබුණේ රු. 150 ක් පමණි. 2015.02.01 අග්‍රිමය පතිපූර්ණය කිරිමට අදාළ නිවැරදි ද්විත්ව සටහන් වන්නේ,

1. සුළු මුදල් පොත හර රු. 2000
   මුදල් පොත බැර රු 2000
2. සුළු මුදල් පොත හර රු. 1850
   මුදල් පොත බැර රු . 1850
2. මුදල් පොත හර රු. 2000
   සුළු මුදල් පොත බැර රු 2000
4. මුදල් පොත හර රු. 1850
   සුළු මුදල් පොත බැර රු . 1850

(34) ගැනුම් ජර්නලයේ එකතුව ලෙජරයට පිටපත් කරන ද්විත්ව සටහන වන්නේ,

1. ගැනුම් ගිණුම හර
   ණය හිමි ගිණුම හර
2. ගැනුම් ගිණුම හර
   ණයගැති ගිණුම බැර
3. ණය ගැති ගිණුම හර
   ගැනුම් ගිණුම බැර
4. ණය ගැති ගිණුම හර
   ගැණුම් ගිණුම බැර

(35) ඉන්වොයිසියක විකුණුම් කොන්දේසි ලෙස 5% 30/ ශුද්ධ 90 ලෙස සඳහන් කර තිබුණි. ඉන් අදහස් වන්නේ,

1. ණය මුදල මැයි මස 30 වන දිනට ගෙවා නිම කළ යුතු බවයි.
2. ණය මුදල් 5.30 ට නොගෙවන්නේ නම් තවත් රු. 90 ක් වැඩිපුර ගෙවිය යුතු බවයි.
3. ණය මුදලේ ශුද්ධ අගය ගෙවීමට දෙන කාලය දින 90 ක් බවත් දින 30 ක් ඇතුලත මුදල් ගෙවන්නේ නම් 5% ක මුදල් වට්ටමක් ලබා දෙන බවත්ය.
4. ණය මුදල ගෙවීමට නියමිත දිනට කලින් කෙදිනක හෝ මුදල් ගෙවන්නේ නම් 5% ක මුදල් වට්ටමක් ලබා දෙන බවයි.
5.

(36) රු. 10,000 ක ලී බඩු ණයට ගැනීම සටහන් කරන මූලික පොත වන්නේ,

1. මුදල් පොත
2. ගැනුම් ජර්නලය
3. විකුණුම් ජර්නලය
4. පොදු ජර්නලය

(37) ශේෂ පිරික්සුමක හර තීරුවේ තිබිය හැකි ගිණුම් ශේෂ ඇතුළත් පිළිතුර තෝරන්න.

1. මුදල් ගිණුම ප්‍රාග්ධන ගිණුම, වැටුප් ගිණුම
2. බැංකු ගිණුම, විකුණුම් ගිණුම, ණය ගැති ගිණුම
3. ණය ගැති ගිණුම, ගැනිලි ගිණුම, ලී බඩු ගිණුම
4. ලී බඩු ගිණුම, ලද වට්ටම් ගිණුම, ලද පොලී ගිණුම

(38) ශේෂ පිරික්සුම පිළිබඳ පහත සඳහන් වගන්ති අතරින් නිවැරදි වගන්තිය තෝරන්න.

1. ලෙජර් ගිණුම්වල ඉදිරියට ගෙනා හර ශේෂය ශේෂ පිරික්සුමේ බැරටත් ඉදිරියට ගෙනා බැර ශේෂ ශේෂ පිරික්සුමේ හරටත් සටහන් කර ඇත.
2. ශේෂ පිරික්සුමේ හරට වත්කම් හා වගකීම් ගිණුම්වල ශේෂත් බැරට වියදම් හා ආදායම් ගිණුම්වල ශේෂත් දක්නට ඇත.
3. ගිණුම්කරණය සම්පූර්ණයෙන් නිවැරදි නම් ශේෂ පිරික්සුමේ හර සහ බැර තීරුවල එකතුව අනිවාර්යෙන්ම සමාන වේ.
4. ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව සමානවීමෙන් මුළු ගිණුම්කරණ ක්‍රියාවලියම නිවැරදි යයි ස්ථිරවම කිව හැකිය.

(39) රු. 12 000 ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වල සටහන් කිරිම සම්පූර්ණයෙන් මග හැරී ඇත. එය නිවැරදි කිරිමේ ද්විත්ව සටහන ,

1. ගැණුම් ගිණුම හර 12,000
   ණය හිමි ගිණුම බැර 12,000
2. ගැණුම් ගිණුම හර 12,000
   අවිනිශ්චිත ගිණුම බැර් 12,000
3. ණය හිමි ගිණුම හර 12,000
   ගැණුම් ගිණුම බැර 12,000
4. අවිනිශ්චිත ගිණුම හර 12,000
   ණය හිමි ගිණුම බැර 12,000

(40) දුරකථන ගාස්තු ගිණුමේ රු 5,000 ක් අඩුවෙන් එකතු කර ඇත. එය නිවැරදි කිරිමේ ද්විත්ව සටහන,

1. දුරකථන ගාස්තු ගිණුම හර රු. 5,000
   මුදල් පොත බැර රු. 5,000
2. දුරකථන ගාස්තු ගිණුම හර රු. 5,000
   අවනිශ්චිත ගිණුම බැර 5,000
3. මුදල් පොත හර රු 5,000
   දුරකථන ගාස්තු ගිණුම බැර රු. 5,000
4. අවනිශ්චිත ගිණුම හර රු 5,000
   දුරකථන ගාස්තු ගිණුම බැර 5,000

The National e-Learning Portal for The General Education

11855

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

වැදගත් :- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යයි. I වන කොටසින් ප්‍රශ්න 2 ක් ද II වන කොටසින් ප්‍රශ්න 2 ක් ද ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතුය.

(1) පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක (I) සිට (X) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් පසු 2015 ජනවාරි මස 01 වන දින කරන්, ලී භාණ්ඩ මිලට ගෙන විකුණන ව්‍යාපාරයක් ආරම්භ කළේය. ඔහු සතු වූ මුදලින් රු 800,000 ක්ද රු 700 000 ක් වටිනා ඉඩමක් ද රු. 500 000 ක් වටිනා වාහනයක් ද මේ සඳහා යොදා ගත්තේය. 2015.01.12 වන දින රු 500 000 ක බැංකු ණයක් ලබා ගත්තේය. කරන් දැඩි කැපවීමකින් කටයුතු කළේය. ලී භාණ්ඩ මිලට ගැනීමට මෙම මස වැයවූ මුදල රු 500 000 කි.

ලී භාණ්ඩ ගෙන ඒම සඳහා වැය වූ මුදල රු 20 000 කි. මිලදී ගත් සියලු ලී භාණ්ඩ අත්පිට මුදලට හා ණයට විකුණා ඇත. අත්පිට මුදලට විකුණුම්වල වටිනාකම රු 1200 000 කි. ණය විකුණුම්වල වටිනාකම රු 400 000 කි.

i. කරන්ගේ ව්‍යාපාරය අරමුණ අනුව හා අයිතිය අනුව කුමන ව්‍යාපාර වර්ගයකට අයත් වේදැයි වෙන වෙනම ලියන්න. (ල.2)
ii. නිෂ්පාදිතයේ ස්වභාවය අනුව මෙය අයත් වන්නේ කුමන ව්‍යාපාර වර්ගයකටද? (ල.2)
iii. කරන්ගේ ව්‍යාපාරය සතු ශක්තීන් 2 ක් ලියන්න. (ල.2)
iv. කරන්ගේ ව්‍යාපාරය තුළ දැකිය හැකි නිෂ්පාදන සාධක 2 ක් නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න. (ල.2)
v. මෙම ව්‍යාපාරයේ 2015.01.01 දිනට ප්‍රාග්ධනය කීයද? (ල.2)
vi. ජනවාරි මස අවසානයේ මෙම ව්‍යාපාරය ලද ලාභය කීයද? (ල.2)
vii. ජනවාරි 31 දිනට ප්‍රාග්ධනය ගණනය කරන්න. (ල.2)
viii. ජනවාරි 31 දිනට මුදල් ශේෂය කීයද? (ල.2)
ix. මෙම ව්‍යාපාරය සතු ජංගම නොවන වත්කම්වල අගය සොයන්න. (ල.2)
x. මෙහි ජංගම වත්කම්වල වටිනාකම කීයද? (ල.2)

(2x10=20)

### I වන කොටස - ව්‍යාපාර අධ්‍යයනය

**(මෙම කොටසින් ප්‍රශ්න 2 කට පමණක් පිළිතුරු සපයන්න.)**

(2) i. (අ) අවශ්‍යතා හා වුවමනා වෙන් වෙන්ව හඳුන්වන්න. (ල.1)
(ආ) භාණ්ඩ හා සේවා අතර දැකිය හැකි වෙනස්කම් 2 ක් සඳහන් කරන්න. (ල.1)
ii. පාසල නැමති ආයතනය කෙරෙහි ඇල්මැති පාර්ශවයන් 2 ක් නම්කර ඒ අය ඇල්ම දැක්වීමට හේතුව බැගින් ලියන්න. (ල.2)
iii. නිෂ්පාදන සාධක නම් කර ඒවාට නිදසුන බැගින් ලියන්න. (ල.2)
iv. පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද දක්වන්න. (ල.02)
අ) ලොව පවතින ඕනෑම ව්‍යාපාරයක ප්‍රධාන අරමුණ ලාභ ලැබීමයි.
ආ) අවශ්‍යතා සීමිත වන අතර වුවමනා අසීමිත වේ.
ඉ) ලී භාණ්ඩ නිෂ්පාදනය කිරීම සේවා ව්‍යාපාරයකි.
ඊ) කළමනාකාරුවන් ව්‍යාපාර කෙරෙහි ඇල්ම දක්වන්නේ තීරණ ගැනීම හා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහාය.

(2x4=8)

(3) i. ආර්ථික පරිසර සාධක 2 ක් සහ දේශපාලන පරිසර සාධක 2 ක් සඳහන් කරන්න. (ල.2)

ii. තාක්ෂණික පරිසරය යන්න පැහැදිලි කර එයින් ව්‍යාපාර වල සිදු වූ වෙනස්කම් 2 ක් දක්වන්න. (ල.2)

iii. ගෝලීය පරිසරය දේශීය ව්‍යාපාර කෙරෙහි ඇතිකරන හිතකර බලපෑම් 2 ක් සහ අහිතකර බලපෑම් 2 ක් බැගින් ඉදිරිපත් කරන්න. (ල.2)

iv. පහත සඳහන් ප්‍රකාශන හරිනම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.

අ) ගනුදෙනුකරුවෝ ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකයකි.

ආ) භාණ්ඩ හා සේවාවල පොදු මිල ගණන් අඛණ්ඩව ඉහළයාම අවධමනයයි.

ඉ) රටක ඉතුරුම් වර්ධනය වන විට ආයෝජනය ඉහළ යයි.

ඊ) තරඟකරුවන් බිහි වීම ව්‍යාපාරයකට තර්ජනාත්මක ලෙස බලපායි. (2x4=8)

(4) i. අයිතිය අනුව ව්‍යාපාර වර්ගීකරණය කරන ගැලීම් සටහන අඳින්න. (ල.2)

ii. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කිරීමේ දී යොදා ගනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක 4 ක් ලියන්න. (ල.2)

iii. සමුපකාර ව්‍යාපාරවල දැකිය හැකි වාසි 2 ක් ඉදිරිපත් කරන්න. (ල.2)

iv. පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) "සිල්වා සහ පුත්‍රයෝ" ඒක පුද්ගල ව්‍යාපාරයකි.

ආ) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබේ.

ඉ) රාජ්‍ය දෙපාර්තුමේන්තුවල අයිතියෙන් 50% ක් පුද්ගලික අංශය සතුය.

ඊ) සාමූහික තීරණ ගැනීමේ හැකියාව හවුල් ව්‍යාපාරයක වාසියකි. (2x4=8)

## II වන කොටස - ගිණුම්කරණය

(මෙම කොටසින් ප්‍රශ්න 2 ක් තෝරා ගන්න.)

(5) i. (අ) ගිණුම්කරණයේ අරමුණ කුමක්ද? (ල.1)

(ආ) ගිණුම්කරණය අවශ්‍ය වීමට හේතු 2 ක් ඉදිරිපත් කරන්න. (ල.1)

ii. චතුෂ්ගේ ව්‍යාපාරයේ 2016 ජනවාරි මාසයේ මුල් සතිය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

2016.01.01 රු 500 000 ක් ප්‍රාග්ධනය යෙදීම.

01.05 රු 100,000 ක් වටිනා භාණ්ඩ අත්පිට මුදලට ගැනීම.

01.10 බැංකුවෙන් රු. 150 000ක ණයක් ගැනීම.

01.15 අයිතිකරුගේ පෞද්ගලික ප්‍රයෝජනයට රු 10,000 ක් වටිනා භාණ්ඩ ගෙනයාම.

ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන අකාරය දක්වන්න.

iii. ඉහත සඳහන් චතුෂ් ව්‍යාපාරයේ ගනුදෙනුවලට අදාල ද්විත්ව සටහන් ලියා දක්වන්න. (ල.4)

iv. එම ද්විත්ව සටහන් ලෙජරයට පිටපත් කර තුලනය කරන්න. (ල.4)

(මුළු ලකුණු 12)

(6) i. මූලික පොත් 4 ක් නම්කර ඒවාට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරන්න. (ල.2)

ii. මුදල් පොතේ ද්විත්ව කාර්ය නම් කර පැහැදිලි කරන්න. (ල.2)

iii. දිලුෂි ව්‍යාපාරයේ 2015 ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

2015.01.01 රු. 500.000 ක් ප්‍රාග්ධනය යෙදීම.

01.04 අත්පිට විකුණුම් රු. 30 000

01.10 ණයට විකුණුම් චමෝද්ට රු. 20.000

එරංගට රු. 15,000

01.15 අත්පිට ගැනුම් රු.40.000

01.20 ණයට ගැනුම් මනෝජ්ගෙන් 25000

මහේෂ්ගෙන් 20.000

01.23 මනෝජ්ට ගෙව්වා රු. 15,000 ලද වට්ටම් 2.000
මහේෂ්ට ගෙව්වා රු. 19,000 ලද වට්ටම් 1,000
01.25 ණයගැතියන්ගෙන් ලැබුණා. චමෝද්ගෙන් රු.13,500 දුන් වට්ටම් රු.1,500
එරංගගෙන් රු. 9000 දුන් වට්ටම රු. 1000
01.30 උපකරණ ගත්තා රු 10 000

ඉහත ගනුදෙනු ඇසුරෙන් වට්ටම් තීරු සහිත මුදල් පොත පිළියෙල කර තුලනය කරන්න. (ල.6)

iv. නයනාගේ ව්‍යාපාරයේ 2015 ජනවාරි මාසයේ ණයට ගැනුම් පිළිබඳ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| දිනය | ඉන් අංක | සැපයුම්කරු | අනෙකුත් තොරතුරු |
|---|---|---|---|
| 2015.01.01 | 15 | කමල් | රෝනියෝ කඩදාසි රු. 6000 කි. අඩුකල වට්ටම 5% යි |
| 2015.01.15 | 25 | නිමල් | ජායා පිටපත් කඩදාසි 10,000 යි. වෙළඳ වට්ටම 10% |

ඉහත තොරතුරු ඇසුරේන් ගැනුම් පර්නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.(මුළු ලකුණු 12)

(7) (i) 2016.02.10 දින චනුදිගේ ව්‍යාපාරය තම ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 20,000 ක් වටිනා උපකරණ සිල්වාගෙන් ණයට ගත්තේය. මෙහි ගනුදෙනු අදාළ මූලික පොතේ සටහන් කරන්න.

(ල.02)

(ii) 2014.12.31 දිනට චමුතු ව්‍යාපාරයේ පහත සඳහන්ව ඇති ශේෂ ඇසුරෙන් ශේෂ පිරික්සුමක් පිළියෙල කරන්න.

| | රු |
|---|---|
| ගැනුම් | 20,000 |
| විකුණුම් | 60,000 |
| ණයගැතියෝ | 12,000 |
| ණය හිමියෝ | 20,000 |
| වැටුප් | 15,000 |
| යන්ත්‍ර | 50,000 |
| ගැනිලි | 5000 |
| ප්‍රාග්ධනය | 22,000 |

(ල.2)

(iii) 2016 ජනවාරි මස 31 දිනට ව්‍යාපාරිකයාගේ බැංකු ගිණුමේ ශේෂය රු. 25,000 කි. එදිනට බැංකුව එවන ලද බැංකු ප්‍රකාශයේ ශේෂය මීට වඩා වෙනස් වේ. එයට හේතු පහත දැක්වේ.

(1) නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් රු. 5,000 කි.
(2) නිෂ්කාශනය නොවූ චෙක්වල වටිනාකම රු. 12,000 කි.
(3) බැංකුව අය කළ බැංකු ගාස්තු රු. 2000 කි.
(4) ස්ථාවර නියෝග රක්ෂණ ගාස්තු රු. 8000 කි.
(5) ණයගැති ප්‍රේෂණ රු. 10,000

ඉහත තොරතුරු ඇසුරෙන් බැංකු ගිණුම සංශෝධනය කර බැංකු සැසඳුම පිළියෙල කරන්න. (ල.4)

(iv) පහත සඳහන් ගිණුම්කරණ දෝෂ නිවැරදි කර පොදු ජර්නල් සටහන් තබන්න.

(1) රු. 10,000 ක් වටිනා විකුණුම් ඉන්වොයිසියක් මගහැරීම.
(2) රු. 15000 ක වැටුප් ගෙවීමක් මුදල් පොතේ පමණක් සටහන් කිරීම.
(3) රු. 8000 කට ලී බඩු මිලට ගැනීමක් ලී බඩු අලුත් වැඩියා කිරීමේ ගිණුමට හර කර තිබීම.
(4) රු. 7000 ක ණයට ගැනුම් අදාළ ගිණුම් දෙකේම බැර කර තිබීම.

(ල.4) (මුළු ලකුණු 12)